**ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ (IWWRMP) ව්‍යාපෘතිය - 2023**

----------------------------------------------------------------------------------------------------

ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ (IWWRMP) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2021 අප්‍රේල් 22 දින එළඹි අංක 6621 - එල්කේ සහ 6619 - එල්කේ ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව වාරිමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, උතුරු පළාත් සභා වාරිමාර්ග දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත් සභා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ජල සම්පත් මණ්ඩලය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ.

ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශය ප්‍රතිසංස්කරණය කිරීම, ජල සම්පත් කළමනාකරණය සඳහා ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම සහ ජල සම්පත් යටිතල පහසුකම්වල ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. වාරිමාර්ග සඳහා වේලි සහ වැඩිදියුණු කළ ජල බෙදා හැරීමේ ජාලවල ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාකාරීව යොමු වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණය, වේලි ආරක්ෂාව ආශ්‍රිත යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම්, හදිසි අවස්ථා ප්‍රතිචාර සහ ව්‍යාපෘති කළමනාකරණය යන සංරචක හතරක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 14,199.43 කට සමාන එ.ජ.ඩො මිලියන 75.03 ක් වන අතර ඉන් රු. මිලියන 13,158.55 කට සමාන එ.ජ.ඩො මිලියන 69.53 ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 1,040.88 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2021 මැයි 13 වන දින ආරම්භ කරන ලද අතර 2025 ඔක්තෝබර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය | ලගාකරගත් කාර්ය සාධනය | | |
| | ඒකක / ප්‍රතිශතය | ඒකක / ප්‍රතිශතය | | |
| ප්‍රසම්පාදන සැලැස්මට අනුව 2021 සිට 2025 දක්වා එ.ජ.ඩො මිලියන 22.13 ක පැකේජ ප්‍රදානය කර තිබුණි. | 2023 වසර සඳහා පැකේජ 41ක් පිරිනැමීමට සැලසුම් කර ඇත. | පැකේජ 24ක් පමණක් ප්‍රදානය කර තිබුණි. | පැකේජ 41 න් 17 ක් ප්‍රදානය කර නොතිබුණි. | ජලාශ වේලි සැපයීම සහ සවිකිරීම , ඇළ මාර්ග පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම්, උපකරණ සහ එසවුම් යන්ත්‍ර සැපයීම සහ ස්ථාපනය කිරීමේ ප්‍රමාදය |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** එකඟ වේ

**විගණකගේ නිර්දේශ** ප්‍රසම්පාදන සැලැස්මට අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කළ යුතුය.

2.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන ගැටළුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් අම්පාර සේනානායක සමුද්‍රය බැම්මට රිප්-රැප් (Rip-Rap) ආරක්ෂාව සහ බැම්ම පාර වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන 532.85 (බදු හැර) වටිනාකමින් යුත් කොන්ත්‍රාත්තුවක් 2022 දෙසැම්බර් 28 දින ප්‍රදානය කරන තිබුණි.රිප්-රැප් (Rip-Rap) සකස් කිරීමේදී ප්‍රමිතියෙන් බාල කළුගල් භාවිතා කර ඇති බවත් එහි මතුපිට උසස් තත්ත්වයේ කළුගල් යොදන බවත් මාධ්‍යවල ප්‍රචාරය වී තිබුණි.මේ සම්බන්ධයෙන් ව්‍යාපෘතිය මගින් විමර්ශනයක් සිදු කර ඇති අතර එහිදී රිප්-රැප්( Rip-Rap) සකස් කිරීම සඳහා වැඩබිමට ප්‍රවාහනය කර තිබූ කළුගල් වර්ග දෙකක කියුබ් 282ක් ප්‍රමිතියෙන් තොර බව අනාවරණය වී ඒවා වැඩබිමෙන් ඉවත් කරන ලෙස කොන්ත්‍රාත්කරුට දන්වා තිබූ අතර රිප්-රැප් සඳහා භාවිතා කරන ලද ප්‍රමිතියෙන් තොර ගල් ඉවත් කර නැවත අලුත්වැඩියා කිරීමට පියවර ගෙන තිබුණි.කොන්ත්‍රාත්කරු රිප්-රැප් ප්‍රදේශයේ ඇතැම් ස්ථානවල ප්‍රමිතියෙන් තොර කළුගල් භාවිත කර ඇති බවද වාරිමාර්ග නිලධාරීන් හඳුනාගෙන තිබුණි. | 2023 ජුලි 7 වන දින අම්පාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා විසින් මෙම ස්ථානය පරීක්ෂා කළ විට, තත්ත්ව පරීක්ෂණ වාර්තා නිකුත් කරන තුරු වේල්ල මත ගොඩගසා තිබූ අංක 5 දරන පෙරහන් ස්ථරයේ ද්‍රව්‍ය නොතබන ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් දෙන ලදී. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් සිදු කරනු ලබන ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය සහ පරීක්ෂණය මත හොඳ සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් අරාවත්ත වැව් බැම්ම වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන 40.02 ක බදු රහිත කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කරන ලද අතර කොන්ත්‍රාත්තුව 2022 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, මෙම කොන්ත්‍රාත්තුව 2024 අප්‍රේල් 30 දක්වා අවස්ථා 03 කදී දීර්ඝ කරන ලද අතර, සමාලෝචිත වර්ෂය අවසානයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 84 ක් විය. කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම හේතුවෙන් මිල වෙනස්වීම් සඳහා රු.මිලියන 19.71 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. | මිල අනපේක්ෂිත තත්ත්වයන් සඳහා වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණවත් නොවූ බැවින් වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් අතිරේක රු.මිලියන 21.58 ක් අනුමත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස දැනට සංශෝධිත ඇස්තමේන්තුව රු. මිලියන 61.60 ක් වන අතර, ඒ අනුව ගෙවීම් සිදු කර තිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදු කරනු ලබන ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය සහ පරීක්ෂණය සඳහා හොඳ සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | මහවැලි අධිකාරියට අයත් පොල්ගොල්ල සහ උඩවලව ජලාශ සඳහා ස්ථිර බර ඉසිලීමේ යන්ත්‍ර දෙකක් සවි කිරීම සඳහා රු.මිලියන 805ක් වෙන් කර තිබුණි.මේ සඳහා ටෙන්ඩරය කැඳවා මාස හතකට පසු, 2022 අප්‍රේල් 8 වන දින, රු.මිලියන 797.61 ක කොන්ත්‍රාත්තු දෙකක් ඉදිරිපත් කර තිබුණි.කෙසේ වෙතත්, රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් ආනයනික අමුද්‍රව්‍ය සඳහා වැඩි පිරිවැයක් දැරීමට හේතු වූ නිසා කොන්ත්‍රාත්කරු කලින් ලබා දුන් මිලට කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමට අකමැති වි තිබුණි. පසුව කොන්ත්‍රාත්කරු රු.මිලියන 1,248.37 කට ව්‍යාපෘතිය නිම කිරීමට එකඟ විය. එහි ප්‍රතිඵලයක් ලෙස පෙර මිලට වඩා | රටේ පවතින විදේශ විනිමය හිඟය හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා කොන්ත්‍රාත්කරු ඇමෙරිකානු ඩොලර්වලින් ගෙවන ලෙස ඉල්ලා සිටින ලදී.IWWRMP ව්‍යාපෘතිය හරහා ලෝක බැංකු අනුමැතියට යටත්ව මේ සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කරන ලදී. උග්‍ර රුපියල අවප්‍රමාණය වීම නිසා, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) දර්ශක මත පදනම්ව මිල අවිනිශ්චිතතාවයන් ගණනය කරන | ව්‍යාපෘතියක් යෝජනා කිරීමට පෙර යෝජනාවේ ප්‍රමුඛතාවය ඉතා හොඳින් සලකා බැලිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 450.76ක් වැඩිපුර ගෙවීමට එකඟ විය. 2023 වසර අවසන් වන විට උඩවලව ජලාශයේ බර ඉසිලීමේ යන්ත්‍රයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 33ක් වූ අතර පොල්ගොල්ල ජලාශයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 37ක් වී තිබුණි. | ලදී. ඩොලර් සංරචකය සඳහා 10% ක අවිනිශ්චිතතාවයක් වෙන් කර ඇති අතර, මෙම මිල අවිනිශ්චිතතාවයන් සඳහා ගිවිසුම් සකස් කරන ලදී. | |
| (ඈ) | 2022 වර්ෂයේදී කොත්මලේ සහ රන්දෙණිගල ජලාශ වේලිවල චලනයන් නිරීක්ෂණය කිරීම සඳහා ස්වයංක්‍රීය භූමිතික (geodetic) මිනුම් පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා එ.ජ.ඩො 1,749,791.18 (රු.මිලියන 629.92) ක මුදලකට විදේශීය සමාගමකට කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි. කොන්ත්‍රාත්තුව මාස 11 කට පසු මිල කැඳවා ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්කරු මුල් මිලට කොන්ත්‍රාත්තුව පිළිනොගත් නිසා 2023 පෙබරවාරි 24 දින මහවැලි අධිකාරිය විසින් කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. මෙම වසරේ ද කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. | කොත්මලේ සහ රන්දෙණිගල ජලාශ වේල්ල නිරීක්ෂණය කිරීම සඳහා ස්වයංක්‍රීය භූමිතික (geodetic) මිනුම් පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා ලංසු කැඳවන ලදී.කොන්ත්‍රාත්තුව 2022 අගෝස්තු 8 වන දින එ.ජ.ඩො 1,749,791.18 ක වටිනාකමකට ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ආර්ථික අභියෝග හේතුවෙන් කොන්ත්‍රාත්කරු එකඟ වූ මිල ගණන් යටතේ ඉදිරියට යාමට කැමැත්තක් දැක්වා නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස 2023 පෙබරවාරි 24 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. | හැකි ඉක්මනින් ලෝක බැංකු මාර්ගෝපදේශයන්ට අනුව කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සඳහා නව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම කල යුතුවේ. |
| (ඉ) | මීට අමතරව, සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 620.29 ක ඇස්තමේන්තුගත වටිනාකමකින් යුත් නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ කොන්ත්‍රාත්තු අටක් ආරම්භ කර නොතිබුණි.මෙම කොන්ත්‍රාත්තු පැවරීමේ කාර්යය ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලදි.දැනට එහි සේවය කරනු ලබන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ එක් කාන්තා ඉංජිනේරුවරියක් පමණක් වන අතර අනුමත ඉංජිනේරුවන් හතර දෙනෙකු සහ එක් කළමනාකරණ සහකාරවරයෙක් නොමැතිවීම දෙපාර්තමේන්තුවේ වගකීම් ඉටුකිරීමට බාධාවක් වී තිබුණි. | නැගෙනහිර පළාතේ ව්‍යාපෘති අටක් නොව හතක් සඳහා සැලසුම් සකස් කර තිබුණි. ඒ අනුව, මෙම ව්‍යාපෘති හතෙන් 5ක් මේ වන විටත් ආරම්භ කර ඇති අතර, ඒ සඳහා අයවැයෙන් වෙන් කර ඇති මුදල රු. මිලියන 383.95 ක් විය. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදු කරනු ලබන ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය සහ පරීක්ෂණය සඳහා හොඳ සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඊ) | අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව, ව්‍යාපෘතිය සඳහා මුලින් වෙන් කරන ලද එ.ජ.ඩො මිලියන 10 (රු.මිලියන 3,000) මහවැලි, උතුරු සහ නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තු යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පුනරුත්ථාපන කටයුතු සඳහා වැය කර තිබුණි.මෙම වැඩසටහන යටතේ රු.මිලියන 2,235 ක් වටිනා වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘති 659 ක් ලෝක බැංකුව විසින් අනුමත කරන ලද නමුත් ව්‍යාපෘති 493 ක කටයුතු පමණක් ආරම්භ කර තිබුණි. | ඇමරිකානු ඩොලර් මිලියන 10ක් යොදා ගනිමින් ප්‍රජා මූලික සංවිධාන විසින් සිදු කිරීමට නියමිත ව්‍යාපෘති 861ක් සඳහා රු. මිලියන 29.50ක් ලෝක බැංකුව විසින් අනුමත කර තිබුණි.ඊට අමතරව, පහත සඳහන් ක්‍රමවේදයන්ට අනුව සැලසුම් සකස් කර ඇති අතර බල ගිණුම් ක්‍රමවේදය යටතේ ව්‍යාපෘති 12 ක්, සාප්පු ක්‍රමවේදය යටතේ ව්‍යාපෘති 10 ක් සහ ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමවේදය යටතේ ව්‍යාපෘති | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් සිදු කරනු ලබන ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය සහ පරීක්ෂණය මත හොඳ සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | 9 ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණි.<br>ප්‍රදානය කරන ලද ව්‍යාපෘති අතරින් 685ක් ආරම්භ කර තිබූ අතර, රු.මිලියන 1,200ක ගෙවීම් දැනටමත් සිදු කර ඇති අතර, මේ දක්වා ව්‍යාපෘති 300ක් අවසන් කර තිබුණි. | |
| (ඔ) | කොත්මලේ, වික්ටෝරියා, රන්දෙණිගල සහ රන්ටැඹේ ජලාශ ඇතුළුව වර්ග කිලෝමීටර් 3,100ක් ආවරණය වන ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශ සඳහා ජල සම්පත් කළමනාකරණ සැලැස්මක් සැකසීම සඳහා ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනයට සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 221.99ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි.මෙම ව්‍යාපෘතිය සඳහා වාර්තා සකස් කිරීමට මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සම්බන්ධ වී තිබුණි. කෙසේ වෙතත්, එම ආයතනවල කාර්ය මණ්ඩලය විසින් නිම කිරීමට නියමිතව තිබූ මෙම කාර්යයන් සැලකිය යුතු පිරිවැයක් යටතේ බාහිර පාර්ශ්වයකට පවරා තිබුණි. | අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අතිරේක ලේකම් (ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව) වෙත යවන ලද සටහනේ දැක්වෙන පරිදි ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශ සඳහා මෙවැනිම ජල සම්පත් කළමනාකරණ සැලැස්මක් මෙම ආයතන විසින් මෙම අවස්ථාවට පෙර සකස් කර තිබුණේද යන්න විමසා බලා තිබුණි. ඉහත සඳහන් ආයතන මීට පෙර මෙවැනි ජල සම්පත් කළමනාකරණ සැලසුම් සකස් කර නොමැති බවත් ඒ සම්බන්ධයෙන් ඔවුන්ට පූර්ව අත්දැකීම් නොමැති බවත් වාර්තා වී තිබුණි. | පැහැදිලි පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයක් ඇතුළුව, බාහිරින් ලබා ගැනීමේ තීරණ සඳහා මාර්ගෝපදේශ ස්ථාපිත කළ යුතු වේ.<br>එය සැලකිය යුතු වටිනාකමක් ගෙන එන විට හෝ සාධාරණ කාල රාමුවක් තුළ අභ්‍යන්තරව සංවර්ධනය කළ නොහැකි විශේෂිත විශේෂඥතාවක් අවශ්‍ය වූ විට පමණක් බාහිරින් ලබා ගැනීම කළ යුතුය . |